# කොවිඩ් 19 - සති පාසල - සබරගමු පළාත
# 9 ශ්‍රේණිය - පුරවැසි අධ්‍යාපනය
# ඒක ක 33 - ප්‍රජාතන්ත්‍රවාදී පාලනය
# පැවරුම් අංක 4 – 4 වන සතිය

ක්‍රියාකාරකම - 9:3:3 ජන සමාජයක එක්සත් බව ඇති ඇති කිරීමට දේශපාලන පක්ෂ මගින් ඉටුකළ යුතු ඉටු කළ යුතු කාර්ය භාරය හඳුනාගැනීම.

හැඳින්වීම - පොදු ප්‍රතිපත්තියක් අනුව කටයුතු කරමින් පාලන බලය ලබා ගැනීම සඳහා සංවිධානය වූ පුද්ගල කණ්ඩායමක් දේශපාලන පක්ෂයක් ලෙස සරලව නිර්වචනය කළ හැකිය.
විවිධ රටවල ක්‍රියාත්මක වන දේශපාලන පක්ෂ ක්‍රම සහ ඒවායේ කාර්යය භාරයන් මෙහිදී හඳුනාගත හැකිය.

ගුණාත්මක යෙදවුම්- පෙළ පොත / සටහන් පොත /පෑන් /ඡන්ද පත්‍රිකා සමග බෙදන පක්ෂ නාම ලේඛනයක්

ක්‍රියාකාරකම් සඳහා සිසුන්ට උපදෙස්

පියවර1 - පෙළ පොතේ පිටු අංක 76- 79 දක්වා අවබෝධයෙන් කියවන්න.
පියවර 2 - කලින් අවස්ථා වල මෙන් ම, අභ්‍යාස පොත භාවිතා කර ප්‍රශ්නය ලියා පිළිතුරු සපයන්න.

<u>ප්‍රශ්නාවලිය</u>

01. මොරිස් ඩුවයිජර් විසින් දේශපාලන පක්ෂ පිළිබඳ ඉදිරිපත් කර ඇති නිර්වචනය කුමක්ද?
02. පක්ෂ පිළිබඳ නිර්වචන සැලකිල්ලට ගෙන ඔබ විසින් දේශපාලන පක්ෂයක් යන්න හැඳින්වීමට පොදු නිර්වචනයක් ගොඩ නගන්න.
03. දේශපාලන පක්ෂයකට අයත් වන කාර්යන් 5ක් ලියන්න.
04. දේශපාලන පක්ෂයක් විසින් ඉටු කළ යුතු කාර්යයන් 3 ක් දක්වන්න.
05. ලෝකයේ ක්‍රියාත්මක වන දේශපාලන පක්ෂ ක්‍රම හඳුන්වා උදාහරණ රටවල් 02 බැගින් දෙන්න.

<u>පසු වැඩ</u>

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන දේශපාලන පක්ෂ නාම නාම ලේඛනය ද අධ්‍යයනය කර, වැඩිහිටි අයගෙන් තොරතුරු රැස්කර ගෙන" රටේ සංවර්ධනයට දේශපාලන පක්ෂ වල දායකත්වය " මැයෙන් ලිපියක් සකස් කරන්න.
(මෙය විෂය විෂයභාරගුරුභවතා ට නිර්ණායක මූලික තක්සේරුකරණය හා ඇගයීමට උපයෝගී කර ගත හැකිය)

පාසල ආරම්භ වූ වහාම මෙම අභ්‍යාස පුරවැසි අධ්‍යාපනය විෂය භාර ගුරු භවතා ට පෙන්වීමට සලස්වන්න.

ඉදිරිපත් කිරීම.
ර/නිවි/පලාවෙල ශ්‍රී රත්නාකර මහා විද්‍යාලයේ,
පුරවැසි අධ්‍යාපනය විෂය භාර ය.
එම්.ඒ.පත්මලතා මිය